## පරිපාලන අභියාචන විනිශ්චය අධිකාරය

AAT/68 /2025 (PSC)

කේ.ටී.පී.එස්.රඹුක්කන,
45/1, පාසල් මාවත,
දෙහිවල.

**අභියාචක**

**එදිරිව**

රාජ්‍ය සේවා කොමිෂන් සභාව

**වගඋත්තරකරු**

**දිනය :-2026.02.03**

| | | |
|---|---|---|
| ඉදිරියේ දී :- | විනිසුරු කේ.ටී.චිත්‍රසිරි | (සභාපති) |
| | ජේ.ජේ.රත්නසිරි | (සාමාජික) |
| | එස්.නන්දසේකරන් | (සාමාජික) |

පෙනී සිටීම :- අභියාචක කේ.ටී.පී.එස්.රඹුක්කන,
අභියාචක වෙනුවෙන් නීතිඥ ප්‍රසන්න රණවැන්න මහතා
වගඋත්තරකාර රාජ්‍ය සේවා කොමිෂන් සභාව වෙනුවෙන් සහකාර ලේකම් සචිනි රඹුක්කමගේ මිය.

### -<u>නියෝගය</u>-

### ජේ.ජේ.රත්නසිරි මැතිතුමා (සාමාජික) පරි.අභි.විනි. අධිකාරය

අභියාචක, 1991.03.07 දින පැවැත්වූ විවෘත තරඟ විභාගයේ ප්‍රතිඵල මත සාමාන්‍ය ලිපිකාර සේවයට II–ආ යටතේ ඇතුළත්ව, 1995.03.07 II–අ හා 2005.05.28 දින I පන්තියට උසස්වීම් ලැබ ඇත. 07/2022 හා 2021.04.09 දින රාජ්‍ය පරිපාලන චක්‍රලේඛනයට අනුව කුසලතා පදනම මත, කළමනාකරණ සේවා නිලධාරී සේවයේ අධිපන්තියට උසස් කිරීම සඳහා වන විභාගයට අයදුම්කර ඇත. අයදුම්කරුවන් 1196 දෙනෙකු සඳහා අදාළවූ තරඟ විභාගය, 2021.11.28 දින විභාග දෙපාර්තමේන්තුව විසින් පවත්වා ඇත. අදාළ තරඟ විභාගයෙන් සහ ඊට අනුරූපීව පැවැත්වූ සම්මුඛ පරීක්ෂණයේ ප්‍රතිඵල මත ඉහළම ලකුණු ලැබූ 171 දෙනෙක් සඳහා 2021.11.28 දින සිට බලපැවැත්වෙන පරිදි පත්වීම් ලිපි 2023.04.19 දින ප්‍රදානය කර ඇත. ඉන්පසුව 2023.04.24 දින සිට දින 10 ක සේවාස්ථ

පුහුණුවක්, ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනය (SLIDA) මගින් පවත්වා ඇත. ඉන්පසුව ප්‍රායෝගික පුහුණුව සඳහා විවිධ ආයතන වලට අනුයුක්ත කර ඇති අතර, අභියාචක රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාරතමේන්තුව තුළදී 2023.05.15 – 2023.05.19 දින දක්වා අදාළ පුහුණුවද සාර්ථකව නිමකර ඇත. ඉන්පසුව 2023.05.23 දින සිට ක්‍රියාත්මක වන පරිදි අභියාචක කොළඹ දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ පරිපාලන නිලධාරී ලෙස පත්කර යවා ඇත. එසේ වුවත් අභියාචක අදාළ පත්වීම් ලිපි ලබා, තනතුර භාරගැනීම සඳහා ගොස් නැත. අභියාචක සහ මෙම විභගයෙන් සමත් ව සිටි තවත් නිලධාරිණියක් (උමයන්ති) ඒකබද්ධ සේවා අධ්‍යක්ෂ ජනරාල් හරහා රාජ්‍ය සේවා කොමිෂන් සභාවට ඉල්ලීමක් කරමින් දන්වා සිටියේ, විදේශ දූත මණ්ඩල සේවය සඳහා කළමනාකරණ සේවයේ නිලධාරීන් තෝරා ගැනීම සඳහා 2023 පෙබරවාරි මස පැවැත්වූ විභාගයෙන් තමා සමත්ව ඇති බැවින්, 2023.05.19 දින ප්‍රසිද්ධ කරන ලද නාම ලේඛනයේ තමාගේ නම ඇතුළත්ව ඇති බවත්, එහි ප්‍රයෝගික පරීක්ෂණ අවසන්වී, අවසාන තෝරා ගැනීමට අනුව ප්‍රතිඵල නිකුත් කරන තාක් මෙම අධිශ්‍රේණියේ පත්වීම භාරගැනීම සඳහා කල් ලබා දෙන ලෙසයි. (ඇමුණුම 09)

මෙම ඉල්ලීමට රාජ්‍ය සේවා කොමිෂන් සභාව 2023.08.23 දින ලිපියක් මගින් දන්වා සිටින්නේ, **"තීරණ ගැනීමේ දී ඇතිවන අවිනිශ්චතභාවය පිළිබඳව අවධානම නිලධාරීන් විසින් දැරිය යුතු බැවින් ද, එකී අවධානම රාජ්‍ය සේවයට හා මහජනතාව වෙත පැවරිය නොහැකි බැවින්ද"** අභියාචනය ප්‍රතික්ෂේප කරන බවය. කෙසේ වුවත් විදේශ දූත මණ්ඩල සඳහා නිලධාරීන් තෝරා ගැනීමේ ප්‍රායෝගික පරීක්ෂණය නාවල ශ්‍රී ලංකා විවෘත විශ්ව විද්‍යාලයේ දී, ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනය විසින්, 2023.09.09 දින පවත්වා ඇත. එහි ප්‍රතිඵල මත 2023.12.14 දින තෝරාගත් අයගේ නාම ලේඛනයක් ප්‍රසිද්ධියට පත්කර ඇත. අදාළ නාම ලේඛනයේ අභියාචකගේ නම ඇතුළත්ව නැත. ඉන් අනතුරුව අභියාචක විසින් 2023.12.21 දින ඒකාබද්ධ සේවා අධ්‍යක්ෂ ජනරාල් වෙත ඉල්ලීමක් ඉදිරිපත් කරමින් දන්වා සිටින්නේ, තමාට මුලින් ලබාදුන් අධි ශ්‍රේණියේ තනතුර නැවත ලබාදෙන ලෙසය. මේ පිළිබඳව අවධානය යොමු කළ රාජ්‍ය සේවා කොමිෂන් සභාව, පෙර අත්දැකීම් ද උපයෝගී කරගෙන මෙම නිලධාරීන් දෙදෙනා සඳහා නැවත පත්වීම් භාරගන්නා දින සිට බලපැවැත්වෙන පරිදි 2024.02.27 දින පත්වීම් ලබා දී ඇත. ඒ අනුව 2024.03.11 දිනට පෙර රාජකාරී භාරගන්නා ලෙසටද උපදෙස් දී ඇත. අදාළ ලිපියට අනුව අනික් තැනැත්තා (උමයන්ති) 2024.03.14 දින කොළඹ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ පරිපාලන නිලධාරී තනතුර භාරගෙන සේවයට වාර්තා කර ඇත.

2024.03.04 දින රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශයේ ලේකම් විසින් අභියාචක දුම්රිය දෙපාර්තමේන්තුවේ පරිපාලන නිලධාරි තනතුරකට පත්වීම් ලබාදී ඇත. අදාළ ලිපිය පරිදි 2024.03.11 දිනට පෙර පත්වීම් භාරගන්නා ලෙසද උපදෙස් දී ඇත. එහි පිටපත් ඒ අවස්ථාවේ නිලධාරියා රාජකාරි කළ මෝටර් රථ ප්‍රවාහන කොමසාරිස් වෙත යවා නිලධාරියාට අදාළ නව තනතුරේ රාජකාරී භාර ගැනීමට හැකිවන පරිදි නිදහස් කරන ලෙසටද උපදෙස් දී ඇත. එසේ වුවත් අභියාචක මෙම අවස්ථාවේ දී ද අදාළ නියෝගය ඉටුකර නැත. නියමිත පරිදි දුම්රිය දෙපාර්තමේන්තුවේ නව තනතුරේ රාජකාරි සඳහා වාර්තා කර නැත. 2024.04.12 දින ආසිරි රෝහලේ වෛද්‍ය ප්‍රතිකාර ලබාගත් බවට සහතික ඉදිරිපත් කර ඇත.

ඉන්පසුව අභියාචක 2024.06.14 දින ලිපියක් මඟින් මෝටර් රථ ප්‍රවාහන කොමසාරිස් මඟින් ඒකාබද්ධ සේවා අධ්‍යක්ෂ ජෙනරාල් වෙත දන්වා ඇත්තේ, "පුද්ගලික හේතු මත වර්තමාන තනතුරේම (කළමනාකරණ සේවා නිලධාරි I) තමා තවදුරටත් සේවය කරන බවය. මේ අනුව දෙවන අවස්ථාවේ දී ද අභියාචක තමාට ලබාදුන් උසස්වීම භාරනොගෙන, තවදුරටත් අදාළ ස්ථානයේම (වරප්‍රසාද සහිත, ප්‍රියතම ස්ථානයේම) රාජකාරි කිරීමට කටයුතු කරන බව දන්වා ඇත.

මෙම තත්ත්වය එසේ තිබියදී මෝටර් රථ දෙපාර්තමේන්තුවේ සේවය කළ ශ්‍රී ලංකා පරිපාලන සේවයේ විශේෂ ශ්‍රේණියේ නිලධරයෙක් වන කුසලානි ද සිල්වා මෙම අධිකාරයේම තීරණයක් මත, ශ්‍රී ලංකා පරිපාලන සේවයේ විශේෂ ශ්‍රේණියේ ලැබූ පත්වීම නැවත සකසා ගෙන, දුම්රිය දෙපාර්තමේන්තුවේ අතිරේක දුම්රිය සාමාන්‍යාධිකාරී පරිපාලන ලෙස පත්වී ගොස්, 2024.10.18 දින රාජ්‍ය සේවා කොමිෂන් සභාව වෙත ලිපියක් යොමු කරමින් දන්වා සිටින්නේ මෙම අභියාචක දුම්රිය දෙපාර්තමේන්තුවේ පරිපාලන නිලධාරි තනතුර සඳහා නැවත පත්කර එවන ලෙසය. අභියාචක රාජ්‍ය සේවා කොමිෂන් සභාව වෙත දන්වා සිටින්නේ, 2024.10.28 දින ලිපිය මඟින් තමා විසින් 2024.06.14 දින ඉදිරිපත් කරනු ලැබූ ඉල්ලීම් ලිපිය ඉවත් කර ගැනීමට සහ නැවත අදාළ තනතුරේ සේවයට වාර්තා කිරීමට අවසර ලබාදෙන ලෙසයි.

මෙම අවස්ථාවේ දී රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශයේ ලේකම් විසින් 2024.10.02 දින ලිපියක්, රාජ්‍ය සේවා කොමිෂන් සභාව වෙත යොමු කරමින් දන්වා සිටින්නේ, අදාළ 2021 වසරේ පැවති විභාගයේ ප්‍රතිඵල මත පත්වීම් ලබාදුන් අය අතරින් 11 දෙනෙක් ඒ වන විටද පත්වීම් භාරගෙන නැති බැවින්, ඒ අයගේ පත්වීම් අවලංගු කර, අදාළ විභාගයේ සුදුසුකම් ලැබූ ලකුණු පිළිවෙළ අනුව ඊළඟට සිටින අයගෙන් ඒ පුරප්පාඩු පුරවන ලෙසටය. එසේම මෙම ලිපියේම අභියාචක තමා මුලින් සිටි තනතුරේ තවදුරටත් සේවය කිරීමට කැමැති බවට

ලිඛිතව දන්වා ඇති බවද සටහන් කර ඇත. එසේම මෙම අධිකාරයේම විභාග වෙමින් පවතින සයින්දමරුදු ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ සේවය කරන ඒ.එල්.අබ්දුල් රෂීඩ් නැමැති අයගේ පත්වීම ද අවලංගු කරන ලෙසද දන්වා ඇත. (ඇමුණුම් 04) එම ලිපියට පිළිතුරු ලෙස රාජ්‍ය සේවා කොමිෂන් සභාව 2024.11.29 දින ලිපියක් මගින් (ඇමුණුම් 11) ලේකම්, රාජ්‍ය පරිපාලන, පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යාංශය දන්වා ඇත්තේ,

I. කේ.ටී.පී.එස්.රඹුක්කන මහත්මියට (අභියාචක) අදාළ තනතුරේ රාජකාරි භාර ගැනීමට අවස්ථාව දීමට.

II. ඒ.එල්.අබ්දුල් රෂීඩ් මහතාගේ පත්වීම අවලංගු කිරීමට.

III. A – J දක්වා නම් සඳහන් 10 දෙනාගේ පත්වීම් අවලංගු කිරීමට.

මේ අනුව එකම විභාගයක ප්‍රතිඵල මත පත්වීම් ලැබ, නියමිත පරිදි පත්වීම් භාර නොගත් 11 දෙනෙකුගේ පත්වීම් අවලංගු කර, දෙවන වරටද පත්වීම භාරනොගත් අභියාචකට පමණක් පත්වීම් භාර ගැනීමට අවස්ථාව සළසා දීම යුක්ති සහගත ද යන ප්‍රශ්නය මතුවේ. මේ පිළිබඳව රාජ්‍ය පරිපාලන ලේකම් මගින් 2024.12.03 දින (ඇමුණුම් 13) නැවත රාජ්‍ය සේවා කොමිෂන් සභාව මේ පිළිබඳව පැහැදිලි කිරීමක් සිදුකර, මෙම අභියාචකට පමණක් නැවත අවස්ථාව සළසා දීම වැරදි පූර්වාදර්ශයක් බවට සඳහන් කරමින් ලිපියක් යොමු කර ඇත. අදාළ නිර්දේශ සළකා බැලූ රාජ්‍ය සේවා කොමිෂන් සභාව, තමාගේ 2024.11.29 දින දරණ ලිපියේ I යටතේ කේ.ටී.පී.එස්.රඹුක්කන මිය, අදාළ තනතුරේ රාජකාරි භාරගන්නා දින සිට ක්‍රියාත්මක වන පරිදි කළමනාකාර සේවයේ නිලධාරීන් අධිශ්‍රේණියට උසස් කිරීමට ලබා දී තිබූ නියෝගය අවලංගු කර ඇත. එම තීරණය නිවැරදිය. අභියාචක මෙම අධිකාරයට පැමිණ ඉල්ලා සිටින්නේ මුලින් වැරදි අයුරින් ලබා දී තිබූ, පසුව නිවැරදි කරන ලද එම තීරණය නැවත ක්‍රියාත්මක කරන ලෙසයි. එය ක්‍රියාත්මක කිරීමට නොහැකි හේතු කිහිපයක් පෙන්වා දිය හැකිය.

I. අභියාචක අවස්ථා දෙකකදී පත්වීම් භාර ගැනීමට අවස්ථාව ලබා දී ඇත. නමුත් අභියාචක එම අවස්ථා දෙකම මගහැර ඇත.

II. අභියචක සමග අදාළ තරග විභාගය සමත් තවත් 11 දෙනෙකු පත්වීම් නියමිත දිනට භාර නොගැනීම නිසා පත්වීම් අවලංගු කර ඇත.

III. දැනමටත් අදාළ විභාගය සමත්, සුදුසුකම් සපුරා ඇති ලේඛනයේ ඊළඟට සිටින අයට පත්වීම් ලබා දී, ඒ පුරප්පාඩු පුරවා ඇත.

IV. තවදුරටත් පවතින පුරප්පාඩු පිරවීම සඳහා 2025.10.18 හා 2025.10.26 දිනයන්හී විභාග පවත්වා ඇත.

V. ප්‍රියමනාප/ දිරි දීමනා ලබන ස්ථානවල සේවය කරන රාජ්‍ය නිලධාරීන්හට උසස් තනතුරක් ලැබුණත්, එම ස්ථාන වලින් ඉවත් නොවී, එම වරප්‍රසාද ලබා, පසුව අදාළ තනතුර ලබා ගැනීමට පෙළඹවීමක් මේ නිසා සිදුවේ. වැරදි පූර්වා දර්ශයකි.

මේ අනුව අභියාචකගේ 2025.03.24 අභියාචනයේ සහ 2025.11.06 දින දරණ ලිපිවල කරුණු මෙන්ම, රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් මෙම අධිකාරයට ඉදිරිපත් කළ 2025.11.26 දින නිරීක්ෂණ වාර්තාවේ කරුණු සහ අදාළ ඇමුණුම් වල සඳහන් කරුණු මෙන්ම, මෙම අධිකාරයේ විවෘත අධිකරණයේ ඉදිරිපත් කළ සියළු කරුණු සැළකිල්ලට ගෙන, මෙම ලබාදී ඇති තීරණයෙහි වරදක් නැති බව ප්‍රකාශ කරමු.

අභියාචකගේ අභියාචනය නිශ්ප්‍රභ කරමු.

ඒ පිළිබඳව අභියාචක, ලේකම්, රාජ්‍ය පරිපාලන හා ලේකම්, රාජ්‍ය සේවා කොමිෂන් සභාව වෙත දන්වන්න.

අභියාචනය ප්‍රතික්ෂේප කරමු.

ජේ.ජේ.රත්නසිරි
(සාමාජික)

මම එකඟ වෙමි

විනිසුරු කේ.ටී.චිත්‍රසිරි
(සභාපති)

මම එකඟ වෙමි

එස්.නන්දසේකරන්
(සාමාජික)

ලලිතා/-